# ශ්‍රී ලංකා රබර් ක්ෂේත්‍රයේ සියවසක අභිමානය

නිල්හානි සෙනෙවිරත්න

ඉතාලි ජාතික දේශ ගවේශක ක්‍රිස්ටෝපර් කොලොම්බස් සිය දේශාන්තර චාරිකාවක දී දුටු හයිටි ජාතිකයන්ගේ අපූරු සෙල්ලම් බෝලයට, ලෝකයට මෙතරම් බලපෑමක් කරන්නට හැකි වෙතැයි ඔහුට නොසිතෙන්නට ඇත. එය හයිටි ජාතිකයින් "කැවු වූ කෑ" නමින් හැඳින්වූ, කඳුළු වගුරුවන ගසක කිරිවලින් තැනූ බෝලයකි. තම ජාතිකයන් කිසිදිනෙක නොදුටු මේ විස්මිත කෙළි භාණ්ඩයේ අමුද්‍රව්‍ය පිළිබඳ විගතුග සෙවීම එතැන් සිට ඇරඹුණි. ඒ පහළොස්වන සියවසයි.

දහඅට වන සියවසේ මැද භාගයේ දී ප්‍රංශ ජාතික ඉංජිනේරුවරයෙකු වූ ප්‍රංශුවා ප්‍රෙස්නෝ විසින් බ්‍රසීලය නිජබිම කරගත් මෙම කිරි ගස හඳුනා ගත් අතර එය *Hevea brasiliensis* නමින් හැඳින්විය. එම වකවානුවේ දී යුරෝපයේ පර්යේෂණාගාරවල රබර් ආශ්‍රිත විවිධ පර්යේෂණ සිදු කළ අතර, ප්‍රථම පර්යේෂණ නිබන්ධනය 1780 දී ඒ. ජූලියන්ස් විසින් ඉදිරිපත් කර ඇත.

විවිධ පර්යේෂකයන් රබර් පිළිබඳ මෙසේ පර්යේෂණ සිදුකරන අතර යුරෝපීය පාලකයෝ මේ අපූරු බෝගය තමන් සතු කරගෙන උපරිම ලාභ ප්‍රයෝජන ලබා ගැනීමට උත්සාහ කළහ. එම උත්සාහයේ ප්‍රතිඵලය 1876 කොළඹ වරායේ නැංගුරම් ලූ ඩියුක් ඔෆ් ඩෙවොන්ෂයර් නම් දුම් නැවෙන් ගොඩබාන ලද වෝඩියන් පෙට්ටි තුළ සුරක්ෂිත ව අසුරා තිබුණි. එහි තිබුණේ වෙනකක් නොව යුරෝපියයන් ගේ ආර්ථිකයට පමණක් නොව අප රටේ ආර්ථික සමාජ පසුබිමට ද, සුවිශාල පෙරළියක් කළ එංගලන්තයේ කිව් රාජකීය උද්භිද උද්‍යානයේ සිට ගෙනා රබර් බීජපැළයි. එය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමේ ගෞරවය සර් හෙන්රි විකම් සතුවන අතර දකුණු අග්නිදිග ආසියාවට රබර් හඳුන්වා දී ව්‍යාප්ත කරවීමේ අභිමානය අප සතුවේ.


[illegible]
a large supply for England
[illegible]
March 6th 1876.

**රූපය 1. සර් හෙන්රි විකම් බ්‍රසීලයේ සිට රබර් බීජ ගෙනා බවට කිව් උද්භිද උද්‍යානයට දැනුම් දුන් ලිපිය**

මෙරටට හඳුන්වා දුන් රබර් බීජපැළ ගම්පහ හෙනරත්ගොඩ රාජකීය උද්භිද උද්‍යානයේ සහ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සිටුවන ලද අතර 1881 වසරේ දී පළමු වරට මල් හට ගැනිණි.

එම වසරේම පේරාදෙණිය උද්භිද උද්‍යානයේ අධ්‍යක්ෂ ආචාර්ය ට්‍රයිමන් විසින් ප්‍රථම වතාවට රබර් කිරි කැපීම පිළිබඳ පර්යේෂණ පැවැත්විය. ඉන් ඇරඹි පර්යේෂණත්, රබර් වගාවේ ව්‍යාප්තියත්, ආකර්ශනීය ආදායමත් ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වූ අතර විසිවන සියවස ආරම්භයේ දී සිරිලක රබර් වගා කරන ලද මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 11,000 ක් විය.

රබර් ශාකයේ නිජබිම ශ්‍රී ලංකාව නොවුවත්, මෙම කාලවකවානුව වන විට රබර් පිළිබඳ පර්යේෂණ සහ විවිධ ව්‍යාප්ති සේවා අතින් අප ඉදිරියෙන් ම සිටි බවට කදිම සාක්ෂිය නම් ලෝකයේ රබර් පිළිබඳ මුල් වරට පවත්වනු ලැබූ ප්‍රදර්ශනය 1906 වසරේ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ පැවැත්වීමයි (1911 වසරේ දී දෙවැනි ප්‍රදර්ශනය එක්සත් රාජධානියේ ලන්ඩන් නුවරදීත්, තෙවැනි ප්‍රදර්ශනය ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවරදීත් පවත්වනු ලැබීය). එකී ප්‍රදර්ශනයෙන් පසු මෙරට වැවිලි කරුවන් කෙතරම් උද්යෝගිමත් වූවා ද යත් 1906 වසර අවසානයේ ලංකාවේ රබර් වැවූ මුළු බිම් ප්‍රමාණය අක්කර 100,000 ඉක්මවිය (Lock 1913).

මෙසේ වැවූ රබර් ඉඩම් ප්‍රමාණය ඉහළයාමත්, වැවිලිකරුවන්ගේ උනන්දුව වැඩිවීමත් සමඟ රබර් පිළිබඳ විධිමත් පර්යේෂණයන්ගේ අවශ්‍යතාවය එකල පාලකයන් වටහා ගන්නට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස වසර 1909 දී කළුතර දිස්ත්‍රික්කයේ වැවිලිකරුවන් පිරිසක් විසින් රබර් කිරි කැටිගැසීම පිළිබඳ කරුණු අධ්‍යයනයට රසායන විද්‍යාඥයෙකුගේ සහාය පැතීමෙන් ඇරඹි රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය, 1913 දී රජය සමඟ ඇති වූ ගිවිසුමකට අනුව රජයෙන් 60% ද, රබර් ආශ්‍රිත සමාගම් වලින් 40% ද, දායකත්වයෙන් තවත් පුළුල් කෙරිණි. රබර් බෝගය අප රටට ආවේණික නොවුවත්, මෙම වකවානුව වන විට විද්‍යාත්මක දැනුම සහ තාක්ෂණය අතින් දියුණු නොවූ අපි, ලෝකයේ ප්‍රථම රබර් පිළිබඳ පර්යේෂණායතනය බිහි කිරීමේ ගෞරවය දිනා ගත්තෝ වෙමු. මෙසේ 1909 දී ඇරඹි රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය 1930 අගෝස්තු 1 වන දින අංක 10 දරණ රබර් අඥා පනතින් ස්ථාපනය කරන ලදි. ක්ලෝඩන් වතුයායේ තිබූ මෙහි ප්‍රධාන කාර්යාලය 1936 නොවැම්බර් මාසයේදී අගලවත්ත ඩාර්ටන්ෆිල්ඩ් වතුයායට ගෙන එනු ලැබීය. වර්ෂ 1951 දී රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය, රබර් පර්යේෂණායතනය නමින් ස්ථාපිත කෙරිණි. ඉන්පසු 1987 අංක 39 දරණ ආඥා පනතින් සහ 2003 අංක 28 දරණ රබර් පනතින් සංශෝධනයන් ඇති විය. රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය ඇරඹි වසරේ සිට මෙතෙක් සිදු වූ පනත් සංශෝධන සහ නව අංගයන් වගුව අංක 1හි සාරාංශ ගත කොට ඇත.

**වගුව 1**. *1909 සිට අද දක්වා සිදු වූ පනත් සංශෝධන සහ එක් වූ නවතාවයන්*

| වසර | නම | නවතාවයන් | පිහිටි ස්ථානය |
|---|---|---|---|
| 1909 | රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය | - | හංවැල්ල ගිකියනකන්ද වත්ත |
| 1913 | රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය | රජයෙන් 60% සහ රබර් ආශ්‍රිත වෙනත් සමාගම් වලින් 40% | හංවැල්ල ගිකියනකන්ද වත්ත |
| 1914 | රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය | රබර් වවන්නන්ගේ ලංකා රබර් පර්යේෂණ අරමුදල | ක්ලෝඩන් වත්ත |

| වසර | නම | නවතාවයන් | පිහිටි ස්ථානය |
|---|---|---|---|
| 1920 | රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය | රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය සහ රබර් වවන්නන්ගේ ලංකා රබර් පර්යේෂණ අරමුදල එක් වීම | හංවැල්ල<br>ගිකියනකන්ද වත්ත<br>ක්ලෝඩන් වත්ත |
| 1926 | රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය | කුඩා ඉඩම්හිමියන් සඳහා උපදේශන සේවා දෙපාර්තමේන්තුව ඇරඹීම | හංවැල්ල<br>ගිකියනකන්ද වත්ත<br>ක්ලෝඩන් වත්ත<br>නිවිතිගලකැලේ |
| 1930 | රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය | 1930 අංක 10 දරණ රබර් පර්යේෂණ ආඥා පනත<br>පාලක මණ්ඩලය<br>රබර් රාත්තලකට ශත1/8 සෙස් බද්ද | හංවැල්ල<br>ගිකියනකන්ද වත්ත<br>ක්ලෝඩන් වත්ත<br>නිවිතිගලකැලේ |
| 1932 | රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය | ලංකාවේ සහ මැලේසියාවේ රබර් පර්යේෂණ සඳහා ලන්ඩන් උපදේශන කමිටු ඇති කිරීම | හංවැල්ල<br>ගිකියනකන්ද වත්ත<br>ක්ලෝඩන් වත්ත<br>නිවිතිගලකැලේ |
| 1933 | රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය | ඩාර්ටන්ෆිල්ඩ් හි පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටු වීම | හංවැල්ල<br>ගිකියනකන්ද වත්ත<br>ක්ලෝඩන් වත්ත<br>නිවිතිගලකැලේ<br>ඩාර්ටන්ෆිල්ඩ් |
| 1942 | රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය | පර්යේෂණ කටයුතු සඳහා හැඩිගල්ල වත්ත ද එක් කර ගැනීම | හංවැල්ල<br>ගිකියනකන්ද වත්ත<br>ක්ලෝඩන් වත්ත<br>නිවිතිගලකැලේ<br>ඩාර්ටන්ෆිල්ඩ් |
| 1951 | රබර් පර්යේෂණ ආයතනය | 1951 අංක 30 දරණ රබර් පර්යේෂණ සංශෝධන පනතින් රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය ලංකා රබර් පර්යේෂණ ආයතනය ලෙස නම් කිරීම | ගිකියනකන්ද වත්ත<br>ක්ලෝඩන් වත්ත<br>නිවිතිගලකැලේ<br>ඩාර්ටන්ෆිල්ඩ් |
| 1987 | රබර් පර්යේෂණ ආයතනය | 1987 අංක 39 දරණ රබර් පර්යේෂණ සංශෝධන පනත | නිවිතිගලකැලේ<br>ඩාර්ටන්ෆිල්ඩ්<br>රත්මලාන<br>කුරුවිට |
| 2003 | ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය | 2003 අංක 28 දරණ රබර් පර්යේෂණ සංශෝධන පනත | නිවිතිගලකැලේ<br>ඩාර්ටන්ෆිල්ඩ්<br>රත්මලාන<br>කුරුවිට |
| 2008 | ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය | 2003 අංක 28 දරණ රබර් පර්යේෂණ සංශෝධන පනත | ඩාර්ටන්ෆිල්ඩ්<br>රත්මලාන<br>කුරුවිට<br>පොල්ගහවෙල<br>මොනරාගල |

1940 ගණන් වලදී දෙවන ලෝක යුද්ධය ඇති වීමත් සමඟ රබර් සඳහා ඉල්ලුම වැඩිවිය. එසේම පර්යේෂණ කටයුතුවල නියැලුණු යුරෝපීය විද්‍යාඥයන්ට යුද පෙරමුණට යාමට සිදු වීමත්, පළමු

අධ්‍යක්ෂතුමා විශ්‍රාම යාමත් නිසා පර්යේෂණ සඳහා සම්පත් දායකත්වයේ අඩුවක් වුව ද, ආයතනයේ සියළු කටයුතු අඛණ්ඩව සිදු විය.

ලංකා රබර් පර්යේෂණ යෝජනා ක්‍රමයේ පළමු අධ්‍යක්ෂ තනතුර දැරීමේ ගෞරවය ටී. ඊ. එච්. ඔබ්රීන් මහතාට හිමි වේ. ඉංග්‍රීසින්ගේ ආධිපත්‍යයට යටත් ව තිබූ රබර් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ධූරයට ශ්‍රී ලාංකේය විද්‍යාඥයෙකු වූ සි. ඒ. ද සිල්වා මහතා 1963 දි පත් වීමෙන් පසු අපේම චින්තනයට අනුව පර්යේෂණ දියත් කෙරිණි. සියවසක් ගෙවෙද්දි අධ්‍යක්ෂවරුන් දස දෙනෙකුගේ අනගි මෙහෙය ලැබූ රබර් පර්යේෂණායතනය එකොළොස්වන අධ්‍යක්ෂතුමා යටතේ අභිමානවත් ලෙස සියවස සමරනු ලබයි.

වගුව 2. *අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ පාලන කාලය*

| අධ්‍යක්ෂවරයා | පාලන කාලය |
|---|---|
| 01. ටී. ඊ.එච්. ඔබ්රීන් මහතා | 1932 - 1946 |
| 02. ආචාර්ය ඊ. රෝඩ්ස් | 1947 - 1949 |
| 03. ආචාර්ය ඊ. ෆිලිප් | 1949 - 1951 |
| 04. ආචාර්ය එච්.ඊ. යන්ග් | 1951 - 1955 |
| 05. ආචාර්ය ඊ. ඩී. සී. බැප්ටිස් | 1956 - 1962 |
| 06. සී. ඒ. ද. සිල්වා මහතා | 1963 - 1965 |
| 07. ආචාර්ය ආර්. ටී. විජේවන්ත | 1965 - 1968 |
| 08. ආචාර්ය ඕ. එස්. පීරිස් | 1968 - 1986 |
| 09. ආචාර්ය ඒ. ද එස් ලියනගේ | 1987 - 1990 |
| 10. ආචාර්ය එල් එම්. කේ තිලකරත්න | 1990 - 2006 |
| 11. ආචාර්ය ඒ. නුගවෙල | 2006 සිට |

රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය ආරම්භයේ පටන් විවිධ ආයතන හා සහයෝගයෙන් ක්‍රියා කර ඇති බව පැහැදිලි කරුණකි.

වගුව 3. *රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය හා අත්වැල් බැඳගත් වෙනත් ආයතන*

| ආයතනය | සේවය |
|---|---|
| 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | - ලංකාවට ගෙනා රබර් බීජපැළ රෝපණය හෙනරත්ගොඩ සහ පේරාදෙණිය උද්භිද උද්‍යාන වල දි සිදු වීම<br>- පළමු සාර්ථක රබර් පැළ බද්ධ කිරීම<br>- වල්පිට සහ හොරණ ගොවිපල වල රබර් බීජ තවාන් පවත්වා ගෙන යාම |
| 2. රබර් පාලක දෙපාර්තමේන්තුව (ආරම්භය 1934) | - නැවත වගා සහනාධාර ලබා දීම<br>- විශාල තවාන් දෙකක් ආරම්භ කිරීම. ඉන් ඇගල්ඔය තවාන ලෝකයේ විශාලම රබර් තවාන විය. |
| 3. තේ පර්යේෂණායතනය (ආරම්භය 1925) | - පර්යේෂණායතන දෙක එක්ව පර්යේෂණ පැවැත්වීම (උදා- ගෙන්දගම් ඉසීම) |



THE LABORATORY AND EXPERIMENTAL FACTORY AT DARTONFIELD ESTATE

**රූපය 2.** ඩාර්ටන්ෆීල්ඩ් වත්තේ ඉදිවූ පර්යේෂණ යෝජනා ක්‍රමයේ 1935 දී ගත් ඡායාරූපයක්

1933 දී කුඩා ගොඩනැගිල්ලක් ලෙස ඩාර්ටන්ෆීල්ඩ් (රූපය 2) හි ඉදි වූ පර්යේෂණායතනය අද දෙපාර්තමේන්තු සහ අංශ 17 කින් ද, උප මධ්‍යස්ථාන හතරකින් ද, යුක්ත ව රබර් වගාව හා සබැඳි පාර්ශවයන්ට අවශ්‍ය පර්යේෂණ සහ සේවාවන් අඛණ්ඩව සපයයි.

1926 වර්ෂයේ පර්යේෂණ කටයුතු සඳහා නිවිතිගලකැලේ ද ඉඩමක් මිල දී ගත් අතර එය "ලංකා ක්ලෝන" නිපදවීමේ මධ්‍යස්ථානයක් ලෙස යොදා ගැනිණි. එසේ නිපදවූ නව ක්ලෝන RRIC (Rubber Research Institute of Ceylon) වශයෙන් නම් කෙරිණි. 1927 දී බද්ධ පැළ 500 නිපදවූ අතර 1934 වන විට එහි පර්යේෂණ කිරි කැපීම් සිදු කරන ලදි. ශාක අභිජනනය, කෘතිම පරාගනය මෙකල සිදු වූ අතර 1932 ස්ථාපිත තවාන්වලින් බද්ධ පැළ විකිණීම ද සිදු විය. තවද ව්‍යාප්ති සේවයේ මධ්‍යස්ථානය ලෙස ද නිවිතිගලකැලේ යොදා ගැනුණු අතර 1937 වසරේ දී පමණ ශාක අභිජනන පර්යේෂණ මධ්‍යස්ථානය ලෙස නිවිතිගලකැලේ ශාඛාව යොදා ගැනිණි. පර්යේෂණායතනයේ පරිපාලනය 1960 දශකයේ දී ශ්‍රී ලාංකේය විද්‍යාඥයින් අතට පත් වීමත් සමඟ නව ක්ලෝන බිහි කිරීමේ ස්වර්ණමය අවධිය උදා විය. 1970 අගභාගය වන විට අනගි ක්ලෝන පහක් නිකුත් කෙරිණි. ඒවා නම් RRIC 45, RRIC 52, RRIC 100, RRIC 103 සහ RRIC 102 යන ක්ලෝනයි. ඉන් RRIC 100, RRIC 103 ක්ලෝන අන්තර්ජාතිකව ද පිළිගැනිණි. මෙහි පුරෝගාමියා ලෙස එවකට ශාක අභිජනන විද්‍යාඥ ලෙස කටයුතු කළ ඩී. එම්. ප්‍රනාන්දු මහතාත්, ඔහුගේ කාර්ය මණ්ඩලයත්, අප කෘතවේදී අභිමානයෙන් සඳහන් කළ යුතු වේ. සියවසක් ගෙවෙන මොහොතේ රෝග වලට ඔරොත්තු දෙන, ඉතාමත් ඉහළ අස්වනු ලබා දෙන, දැව පරිමාව අධික නව ක්ලෝන මෙන්ම විවිධ දේශගුණික තත්ත්වයන් යටතේ ද වගා කළ හැකි ක්ලෝන බිහි කර ඇති අතර ඒවා RRISL 200 සහ RRISL 2000 ශ්‍රේණි වලින් වගා කරුවන් අතට පත්වේ. එසේම සියවස සැමරුම වෙනුවෙන් අප නිපද වූ අගනා නව ක්ලෝන වගා කරුවන් වෙත නිදහස් කිරීමට ද කටයුතු සම්පාදනය කර ඇත.

රබර් ගස සිරිලකට හඳුන්වා දී වසර පහක් ගෙවුණු තැන කිරි කැපීම පිළිබඳ පර්යේෂණ ඇරඹිණි. රබර් ආශ්‍රිතව මෙරට සිදු කළ ප්‍රථම පර්යේෂණය ද එය වන අතර එහි ගෞරවය පේරාදෙණිය උද්භිද උද්‍යානයේ අධ්‍යක්ෂ ආචාර්ය ට්‍රයිමන්ට හිමිවේ. රබර් ගසේ කායික විද්‍යා පරීක්ෂණ, බීජ නිපදවීම, පැළ රෝපණය, බද්ධ ක්‍රම, බද්ධ පැළ, පතේල වියළීම පිළිබඳ පර්යේෂණ 1910 වන විට ආරම්භ කර තිබුණි. එමගින් රබර් පැළ සිටුවා අවුරුදු පහකින් කිරි කැපිය හැකි බවත්, කඳවටය අඟල්

18 වු ගස්වල පොළොවේ සිට අඩි 3 ක් ඉහළින් කිරි කැපීම සුදුසු බවත්, කොළ හැලෙන පෙබරවාරි මාර්තු මාසවල කිරි නොකැපීමත්, වැඩි තිව්‍රතාවලින් කිරි කැපීමේ දී පතේල වියලෙන බවත් රබර් සමඟ අතුරුබෝග වගා සිදු කළ හැකි බවත් එකල නිර්දේශ කෙරිණි. මෙම පර්යේෂණයන් දිනෙන් දින වැඩි දියුණු වු අතර 1937 වන විට ශාක විද්‍යා දෙපාර්තමේන්තුව යටතේ මෙම පර්යේෂණයන් සිදු කෙරිණි. පසු කාලීනව වැනි ආවරණ යෙදීම, උත්තේජක භාවිතය සහ වර්තමානයේ වැඩි දියුණු කළ කිරි පිහි නිපදවීම, ප්‍රමිති රෝපණ ද්‍රව්‍ය නිපදවීම එම දෙපාර්තමේන්තුව මගින් සිදු කරමින් පවතී.

1903 දී ලංකාණ්ඩුවේ දිලීර විද්‍යාඥ පදවිය හෙබවු ජේ.බී. කැරුතස් විසින් ශ්‍රී ලංකාවේ රබර් වගාවේ පළමු රෝගය වාර්තා කළේය. එය නෙක්ට්‍රියා නම් දිලීරය මගින් කඳේ සාදනු ලබන පිළිකා රෝගයයි. ටි. පෙච් නම් විද්‍යාඥයා විසින් ලංකාවේ රබර් රෝග පිළිබඳ පළමු වාර්තාව ප්‍රකාශයට පත් කළ අතර එය ලෝකයේ රබර් රෝග පිළිබඳ ප්‍රථම වාර්තා කීපයෙන් එකක් ද වේ. එහි පත්‍ර රෝග හයක් ද, වර්තමානයේ ද අනර්ථකාරී රෝගයක් වන සුදුමුල් රෝගය ඇතුළුව මුල්රෝග දෙකක් ද, කඳට වැළඳෙන රෝගයක් ද, ඵල කුණු වීමේ රෝගයක් ද අන්තර්ගත වී ඇත.

රබර් පර්යේෂණ යෝජනා ක්‍රමය අරඹා වසර දෙකක් ගෙවුනු තැන 1911 දී ටි. පෙච් විසින් රබර් රෝග පිළිබඳ ලියන ලද ලෝකයේ ප්‍රථම කෘතිය The physiology and diseases of *Hevea brasiliensis* ප්‍රකාශයට පත් කරන ලදි. එහි රබර් වගාවට හානි කරන රෝග හඳුනාගැනීම, රෝග ලක්ෂණ, රෝග වළක්වා ගැනීම සහ මර්දනයට අදාල කරුණු සවිස්තරව දක්වා ඇත. වසර 1950 වන විට රබර් ගසට රෝග සාදනු ලබන රෝග කාරකයින් 16 දෙනෙකු හඳුනා ගෙන ඇත. එකල මෙම රෝග මර්දනයට බහුලවම රසායනික ද්‍රව්‍ය යොදා ගෙන ඇත. 1960 දශකයේ දී ආයතනයේ පරිපාලනයට ලාංකිකයන් දායක වීමත් සමඟ අප රටට ගැලපෙන විකල්ප රෝග මර්දන ක්‍රම සෙවීමට උත්සුක වූහ. අද වන විට රබර් වගාවට හානි කරන රෝග කාරකයින් 64 පමණ හඳුනාගෙන ඇත. 1905 සිට 1938 දක්වා කාලය අතරතුර ලංකා රබර් පර්යේෂණ යෝජනා ක්‍රමයේ සේවයේ නියුතු ටි.පෙච් සහ තවත් විද්වතුන් තිදෙනෙකු විසින් ඉන් රෝග කාරකයින් දහසය දෙනෙකු ප්‍රථම වරට වාර්තා කර ඇති අතර පසුගිය වසර 50 තුල ලාංකේය විද්‍යාඥයින් විසින් රෝග කාරකයින් දස දෙනෙකු පමණ හඳුනාගෙන ඇත. ඉන් හය දෙනෙකු සොයා ගැනීමේ ගෞරවය වත්මන් නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව විද්‍යා) තනතුර දරණ ආචාර්ය සි.කේ.ජයසිංහ මහතා ට සහ ඔහුගේ පර්යේෂණ කණ්ඩායමට හිමි වේ. මේ රෝග කාරකයන් ඒකාබද්ධ පළිබෝධන ක්‍රමෝපාය යටතේ එනම් රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කර, නිවැරදි වගා පාලන ක්‍රම, ප්‍රතිරෝධී ක්ලෝන භාවිතය, ජෛව විද්‍යාත්මක රෝග පාලනය හා ශාක නිරෝධායන ප්‍රතිපත්ති අනුගමනය කරමින් රබර් වගාව තවත් කාලයක් පැවතීමට කටයුතු සැලසීම වර්තමාන ව්‍යාධි සහ ක්ෂුද්‍රජීව විද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යභාරයයි.

1913 වර්ෂයේ ප්‍රකාශයට පත් වූ එවකට පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ අධ්‍යක්ෂ ධූරය දැරූ එච්. ලොක් මහතා විසින් රචිත Rubber & Rubber Planting නම් ග්‍රන්ථයේ වගා බිම් තේරීම, රබර් වැවීමට සුදුසු පස් පිළිබඳ, පාංශු විශ්ලේෂණ වාර්තා ඇතුලත්ව ඇත. තවද එම කාල වකවානුවේදී ම ආවරණ බෝග සඳහා කොළ පොහොර සඳහා සුදුසු රනිල බෝග ද නිර්දේශ කර ඇත. මෙසේ පස පිළිබඳ පර්යේෂණ දිගින් දිගට ම සිදු කරමින් පවතිද්දී 1938 දී එක් පාංශු රසායනඥවරයෙකු ගෙන්

ඇරඹි පාංශු විද්‍යා දෙපාර්තමේන්තුව මගින් විධිමත්ව පස සහ පොහොර පිළිබඳ පර්යේෂණ ආරම්භ විය. වර්තමානයේ පාංශු සහ පත්‍ර විශ්ලේෂණය මඟින් පොහොර නිර්දේශය, ක්ෂේත්‍ර විශේෂිත පොහොර නිර්දේශය, නව ආවරණ බෝගයක් වන මුකුනා සොයා ගැනීම සහ ඒකාබද්ධ වල් නාශක ආශ්‍රිත සාර්ථක පර්යේෂණයන් සිදු කරනු ලබයි.

රබර් පර්යේෂණ යෝජනා ක්‍රමයේ ආරම්භක විද්‍යාඥයා රසායන විද්‍යාඥයෙකු විය. රබර් කිරි කැටි ගැසීම සම්බන්ධ ගැටලු වලට හේතු සෙවීමට ඇරඹි පර්යේෂණ අද ඉතාම ඉහළ නවීන උපකරණ අනුසාරයෙන් සිදුවේ. බහු අවයව රසායන, දල රබර් සැකසුම් සංවර්ධන සහ රසායන ඉංජිනේරු, රබර් තාක්ෂණ සහ රසායන විශ්ලේෂණ, පිරිවිතර යන දෙපාර්තමේන්තු වලින් රබර් කිරි ආශ්‍රිත රසායන විද්‍යා පර්යේෂණ, රබර් භාණ්ඩ, අපසන්දන ප්‍රතිකාර ක්‍රම සහ විවිධ රසායන විශ්ලේෂණයන් සිදු කරනු ලබයි. ලෝකයේ ශල්‍යකර්ම සඳහාම වූ අත්වැසුම් නිෂ්පාදන කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව ප්‍රධාන වන අතර ඒවායේ තත්ත්වය ඉහළ නැංවීමට රබර් තාක්ෂණ දෙපාර්තමේන්තුවල පර්යේෂකයන්ගේ අනගි මෙහෙයක් ලැබේ. අතීතයේ දින ගණන් වේලූ රබර් ෂීට් ඉතා පහසුවෙන් එක් දිනකින් වියලා ගැනීමේ දුම් ගෙයක් නිර්මාණය කර ඇත. එසේම ඔවුන් අපතේ යන රබර් සඳහා ද විවිධ පර්යේෂණයන් සිදු කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස අපරිණත වගාවේ දි වල් මර්දකයක් ලෙස යොදා ගත හැකි පරිසර හිතකාමී ආවරණයක් ද (power mat) නිපදවා ඇත.

සියවසක් සපිරෙන තැන අපට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය ද සිහිපත් කළ යුතු වේ. 1909 පර්යේෂණ යෝජනා ක්‍රමය ආරම්භයේ සිට 1930 දක්වා ලැබුණු රාජ්‍ය අනුග්‍රහයන් ද 1930 දි රබර් පර්යේෂණ ආඥා පනත ඉදිරිපත් කර, වරින් වර එය සංශෝධනයන්ට ද ලක් කරමින් අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය නිබඳව ලැබුණි. අවසන් වරට එම පනත සංශෝධනය වුයේ 2003 වසරේ දි ය. එකදාස් නමසිය තිස් ගණන්වලදි පැතිර ගිය ඔයිඩියම් පත්‍ර රෝගය වැළැක්වීමට විශාල වශයෙන් ගෙන්දගම් කුඩු ඉසීම සිදු කළ අතර ඒ සඳහා ද රාජ්‍ය අනුග්‍රහය ලැබුණි (රූපය 3). රබර් කර්මාන්තය සම්බන්ධ මුද්දර නිකුත් කිරීම ද (රූපය 4) ඒ සඳහා කදිම සාක්ෂියකි.



**රූපය 3.** 1935 වසරේ දි ඔයිඩියම් රෝගය මැඩලීමට ගෙන්දගම් කුඩු ඉසීමට රබර් වගා කරුවන් දැනුවත් කිරීම සඳහා පැවති පෙරහැරක්




**රූපය 4.** පිළිවෙලින් 1935, 1938, 1954 සහ 2002 දී ශ්‍රී ලංකාවේ නිකුත් කරන ලද මුද්දර

1953 දී පැවති තුන් වන රබර් සමුළුවේ ප්‍රධාන ආරාධිතයා වූයේ ද එවකට කෘෂිකර්ම සහ ආහාර ඇමති ධූරය දැරූ අමාත්‍යවරයායි. රබර් කර්මාන්තයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වැදගත්කම හඳුනාගත් එවක පාලකයෝ ලංකාවෙන් රබර් චීනයට යවා චීනයෙන් සහල් මෙරටට ගෙන්වීම සඳහා රබර්/සහල් ගිවිසුම 1967 නොවැම්බර් මස දී අත්සන් කිරීමෙන් පැහැදිලි වනු ඇත.

අන්තර්ජාතික සබඳතා සැලකීමේ දී ස්වභාවික රබර් නිපදවන්නන් ගේ සංගමය (ANRPC), අන්තර්ජාතික ස්වභාවික රබර් සංවිධානය (INRO), ආසියා පැසිපික් කලාපයේ ශාක ආරක්ෂක කමිටුව, අන්තර්ජාතික රබර් අධ්‍යයන කණ්ඩායම (IRSG) සහ අන්තර්ජාතික රබර් පර්යේෂණ හා සංවර්ධන මණ්ඩලය (IRRDB) යන සංවිධාන සමඟ අත්වැල් බැඳගෙන රබර් වගාවත්, පර්යේෂණත් අන්තර්ජාතික මට්ටමින් සිදු කිරීම අතිශයින්ම වැදගත් ය.

1980 දශකයේ සිට මෙතෙක් අපට විවිධ වූ රබර් පර්යේෂණයන් සඳහා අන්තර්ජාතික සම්මාන හතරක් ද, ජාතික සම්මාන 11 ක් ද ලැබීම සියවසේ අභිමානය තවත් ඔප් නංවන්නකි.

සියවස් චාරිකාවේ ආපසු හැරී බැලීමේ දී ලද ජයග්‍රහණ පිළිබඳ අභිමානයේ නිහතමානී සතුට අප අද විඳිනුයේ ගෙවුණු සියවස තුල මෙහි සේවය කළ සියළු දෙනාගේ කැප වූ සේවය නිසාවෙනි. ඔවුන් සියළු දෙනාම ස්තුතිපූර්වක භක්ත්‍යාදරයෙන් සිහිපත් කරන අතර අනාගතයේ රබර් ආශ්‍රිත සියළු ගැටළු සඳහා විසඳුම් සොයන ප්‍රධාන පර්යේෂණායතනය ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය ලෙසට ලෝකයේ ප්‍රකට කිරීම වර්තමාන සේවක මඩුල්ලේ වගකීම වන්නේය. එවිට තවත් සිය වසක් ගෙවෙන කල්හි එය සමරන පරපුරට ද, අද අප විඳිනා අභිමානයේ සතුටටත් වඩා වැඩි සතුටක් භුක්ති විඳිමට හැකි වනු ඇත.

### පරිශීලනය කළ ග්‍රන්ථ

Lock, R.H. (1913). Rubber and Rubber Cultivation, Cambridge University Press, UK.

Webster, C.C. and Baulkwill, W.J. (1989). Rubber, Longman Group, UK.

රබර් පර්යේෂණ යෝජනා ක්‍රමයේ සහ රබර් පර්යේෂණ ආයතනයේ සියලුම වාර්ෂික වාර්තා සහ කාර්තු වක්‍රලේඛ.